PIRELLI

# ටයර් නඩත්තුව, ආරක්ෂාව සහ හිමිකම් ප්‍රතිපත්ති සඳහා වූ අත්පොත

ටොයොටා ලංකා (පුද්ගලික) සමාගම

අනුක්‍රමික අංකය

"පාලනයෙන් තොර බලයෙන් පලක් නැත"

**"POWER IS NOTHING WITHOUT CONTROL"**

## වායුව පිරවීම

මසකට වරක් පරීක්ෂා කොට වාහනයට රෙකමදරු කරන වායු පීඩනය පවත්වා ගන්න.

## චක්‍රීකරණය

ටයර් චක්‍රීය කරණය වාහනය නිෂ්පාදිතයාගේ රෙකමදරුව හෝ කි.මී 8,000 කට වරක් කරන්න.

## පරීක්ෂාව

පුරුද්දක් ලෙස කට්ට ගෙවීම, පළුදුවීම් සහ හානිවීම් සොයා බලන්න.

| පටුන | පිටුව |
|---|---|
| හැඳින්වීම | 3 - 4 |
| පණිවිඩය | 5 |
| යුරෝපා සංගමයේ ටයර් ලේබල් | 6 - 13 |
| කාර්මික උපදෙස් | 14 - 15 |
| පිරෙලි ආරක්ෂාව | 16 - 22 |
| වාහන අයිති කරුවන්ට උපදෙස් | 23 - 31 |
| ටයර් හිමිකම් පිළිවෙත | 32 - 36 |
| පාරිභෝගික ප්‍රකාශණය | 37 - 40 |
| පාරිභෝගිකයා, වාහනය සහ ටයර් හඳුනා ගැනීම | 41 - 45 |

## අප සුවටිනා පාරිභෝගිකයන්ට පණිවිඩය

පිරෙලි ටයර් සඳහා ඔබ දැක්වූ විශ්වාසය සහ අනාගතයේ දී නිරන්තරව කරන්නා වූ මිලදී ගැනීම් සඳහා ඔබට අපගේ ස්තූතිය පිරිනමමු. කරුණාකර මෙම ටයර් නඩත්තු අත්පොත නොවිසේ නම් ටයර් නඩත්තුව, ආරක්ෂාව සහ හිමිකම් ප්‍රතිපත්ති සඳහා වූ අත්පොත හොඳින් කියවා නිරතුරුව භාවිත කරන්න. තවද මෙම අත්පොත සැම විටම ඔබගේ රථයේ තබන්න. ඔබගේ පිරෙලි ටයර්යන්හි විශිෂ්ඨ ක්‍රියාකරිත්වය සහ දිගු කාලීන පරිහරණය තුලින් නියම රිය පැදවීමේ ආශ්වාදය සහ ආරක්ෂාව මෙය ඔබට ලබා දෙනු ඇතැයි අප විශ්වාස කරමු.

මේ පිළිබඳ ඔබට ඇති ඕනෑම විමසීමකට කරුණාකර අප අමතන්න. ඒ සඳහා සතුටින් සහාය දීමට අප සූදානම්ව සිටිමු.

**පිරෙලි කණ්ඩායම**

අමතන්න - 0112 939 000 දිගු අංක 425 සහ 427

## යුරෝපා සංගමයේ ටයර් ලේබල සඳහා වන නියාමනය (අංක.1222/2009)

යුරෝපා සංගමයේ අවශ්‍යතාවයට අනුව ටයර් ලේබලයක ඉන්ධන පිරිමැසීම (භ්‍රමණ ප්‍රතිරෝධය), තෙතමනය ඇති අවස්ථාවල ග්‍රහණය සහ ටයරයක බාහිර ශබ්දය ප්‍රදර්ශනය කළ යුතුවේ. මෙහි අරමුණ වන්නේ ආරක්ෂාකාරී, ඉන්ධන පිරිමසන සහ බාහිර ශබ්දය අවම ටයර් තුලින් වැඩි ආරක්ෂාවක් සහ කාර්යක්ෂමතාවයක් ඇති මාර්ග ප්‍රවාහනයක් ප්‍රවර්ධනය කිරීමයි. මෙසේ ටයරයක ඉන්ධන පිරිමැසීම සහ අනෙකුත් පරාමිතීන් පිළිබඳව වැඩි විස්තර අවශ්‍යවන්නේ පාරිභෝගිකයන්ට විවිධ ටයර් අතර ක්‍රියාකාරිත්වයේ වෙනස්කම් ලෙහෙසියෙන් සැසඳීමට හැකියාව ඇති කිරීම තුලින් ටයර් තෝරා ගැනීමේදී වඩාත් දැනුවත්ව තෝරා ගැනීමක් කළ හැකි බැවිනි.

මෙම නියාමනයේ අවශ්‍යතාවය වන්නේ 2012 ජුලි මස 1 වනදට පසු නිෂ්පාදනය කොට 2012 නොවැම්බර් මස 1 වනද සිට විකිණීමට ඇති සියලුම ටයර්වල මෙම විස්තර සහිත ස්ටිකරයක් හෝ ටයරය අසලම ලේබලයක් තැබීම සහ මිලදී ගැනීමට ප්‍රථම එය පාරිභෝගිකයාට පෙන්වාදීමයි.

## ආරක්ෂාව සඳහා පිරෙලි

සුපිරි වෙළඳ නාමයක් වන පිරෙලි, ටයර් ලේබල් හඳුන්වා දීම පිළිගන්නා අතර එයට පූර්ණ සහයෝගය දෙනුයේ අවසාන-පාරිභෝගිකයා නව ටයර් මිලදී ගන්නා විට විනිවිද භාවය තුලින් තොරතුරු ලබාගැනීමට ඉමහත් උපකාරයක් වන බැවිනි. විශේෂයෙන් ඉන්ධන පිරිමැස්ම සහ මාර්ගාරක්ෂාව, රියදුරු චර්යාව මත රඳා පවතින බව පාරිභෝගිකයන් විසින් සිහි තබාගත යුතුය. එසේම ඕනෑම අවස්ථාවකදී ආරක්ෂාව තහවුරු කිරීමටත්, ටයර්වල ආයු කාලය වැඩි කිරීමටත්, එමගින් මුදල් ඉතිරියටත්, ටයර් නිසියාකාරව පරිහරණයත්, නඩත්තුවත්, ටයර්වල ලක්ෂණයන් පිලිබඳව දැනුවත්වීමත් වැදගත්වේ.


භ්‍රමණ ප්‍රතිරෝධය, තෙත් පෘෂ්ඨ මත ග්‍රහණය සහ බාහිර ශබ්දය ටයරයක ක්‍රියාකාරිත්-වයේ දර්ශකයන් වුවත් එහි පරිපූර්ණ වටිණාකම ගණනය සඳහා සාධක රැසක් (තෙත සහ තෙත් නොවන පෘෂ්ඨ දෙක මත හැසිරවීම, වේගයෙන් දිවෙන විට ස්ථාවරත්වය, තෙත් නොවන පෘෂ්ඨ මත නැවතීම, දිවෙන දුර) අදාල වන අතර පිරෙලි ටයර් මේ සියලු තත්ත්ව යටතේ පරීක්ෂා කෙරේ. ආරක්ෂාව වඩාත්ම වැදගත් සාධකය වන අතර සියලුම ක්‍රියාකාරිත්ව දර්ශකයන් වල ප්‍රශස්ත තුලනයක් පවත්වා ගැනීම පිරෙලි හි අරමුණයි.

මෙහිදී ගනුදෙනු කරුවන්ගේ විවිධ අවශ්‍යතා හඳුනාගෙන ඔවුනට සුදුසු ටයර් මිලදී ගැනීම රෙකමදරු කළ හැකි විශේෂඥ දැණුමක් ඇති ටයර් වෙළඳුන් ප්‍රශස්ථ සේවාවක් සපයයි.

# නවතම ටයර් ලේබල හඳුනා ගමු



ඉන්ධන භාවිතය අඩු කිරීම




ටයරයක භ්‍රමණ ප්‍රතිරෝධයට සාපේක්ෂව ඉන්ධන පරිභෝජනය

මෝටර් කාරයක සමස්ත ඉන්ධන පරිභෝජනය 20% ක් සහ ට්‍රක් රථයක 35% ක් දක්වා බලපෑමකට ටයර් දායක වේ. යුරෝපා සංගමයේ රෙගුලාසි අනුව භ්‍රමණ ප්‍රතිරෝධය මෝටර් කාරයකට ශ්‍රේණිගත කර ඇත්තේ A (උසස්) සිට G (දුර්වල).

මූලාශ්‍රය : පිරෙලි ටයර්

ලේබල් වර්ගය - C සිට B දක්වා
වාහන වර්ගය - සෙඩාන් - පෙට්‍රල්
වසරකට කි.මී - 20,000
විවිධ මාර්ග වල ධාවනය

C ටයරයක සහ B ටයරයක අතර වෙනස වන්නේ ඉන්ධන පරිභෝජනය 2.5% - 4.5% අතර කාරයකට ද 5% - 8% අතර ට්‍රක් රථයකට ද අඩු හෝ වැඩි වීමයි.


මූලාශ්‍රය ඃ පිරෙලි ටයර්

| | | |
|---|---|---|
| පරිභෝජනය අඩු කිරීම | ඉන්ධන ඉතිරිය ලීටර වලින් | අඩු කළ මුළු $CO_2$ |



තෙත් පෘෂ්ඨ මත
වඩා ආරක්ෂාව


තෙත් මාර්ග මත ග්‍රහණය ආරක්ෂාව සම්බන්ධව ටයරයක ඇති අතිශය වැදගත් ලක්ෂණයකි. තෙත තත්වයන් වල විශිෂ්ඨ ග්‍රහණයේ ප්‍රතිඵලය කෙටිම දුරකදී නැවැත්වීමයි.




තෙත පෘෂ්ඨ මත
ග්‍රහණය ආශ්‍රිත
ආරක්ෂාව

මූලාශ්‍රය : පිරෙලි ටයර්


කාර් ටයර් සඳහා විවිධ පන්ති අතර වෙනසින් අදහස් වන්නේ පැයට කි.මී 80 ක වේගයෙන් ධාවනය කරන විට නැවැත්වීමේ දුර මීටර් 2.6 ක් අඩු හෝ වැඩි වීමයි*




* TÜV SÜD ටයර් පරීක්ෂණ වාර්තාව n° 76247671 2011 වර්ෂය (පිරෙලි ටයර් 225/50 ZR17 ප්‍රමාණයෙන්) ** studded ටයර් හැර.



ශබ්දය පිටවීම අඩු කිරීම




බාහිර ශබ්දය (ඩෙසිබල්)

වැදගත් පාරිසරික සාධකයක් වන රථ වාහන ශබ්දයට රථ වාහන ප්‍රමාණය, රථ වාහන වර්ගය, රථ වාහන පදවන ආකාරය, ටයරයත් මාර්ගයත් අතර අන්තර්ක්‍රියාව දායකවේ.


ටයරයේ ලේබලයේ ඇති අගයෙන් පෙන්නුම් කරන්නේ රිය ධාවනයේදී රියදුරුට ඇසෙන ශබ්දය නොව පාරිසරික දූෂණයට දායක වන බාහිර ශබ්දයයි.


එබැවින් රථ වාහන වලින් නිකුත් වන ශබ්දය අඩු කිරීමට පිටත භ්‍රමණ ශබ්දය අවම කරන ටයර් මිලදී ගැනීම සුදුසුවේ.

මූලාශ්‍රය : පිරෙලි ටයර්




**1 ශබ්ද තරංග**
**සීමාවට වඩා 3 db (A) අඩු**
of EC Reg 661/2009.






**2 ශබ්ද තරංග**
යුරෝපා සංගම් 661/2009 සීමාව සපුරයි.
(+ 1 තරංගය = + 3 db = ශබ්දය දෙගුණයකි)






**3 ශබ්ද තරංග**
යුරෝපා සංගම්. 2001/43 සීමාව සපුරයි.
(+ 2 wave = + 6 db = ශබ්දය සිව් ගුණයකි)



## කාර්මික උපදෙස්

පැති බිත්ති වල සටහන්

1. වෙළඳ නාමය 2. නිෂ්පාදිත නාමය



* පිටු අංක 14 රූපය හා බැඳි පැති බිත්ති සලකුණු

| 205 | 55 | R | 16 | 94 | V |
|---|---|---|---|---|---|
| ප්‍රකාශිත කොටසේ පළල මිලි මීටර් වලින් | ප්‍රකාශිත කොටසේ පළල සහ උස අතර අනුපාතය. මෙය ටයරයේ සාපේක්ෂ අනුපාතය ලෙස ගැනේ | රේඩියල් නිෂ්පාදිත ටයරය | රිම් විශ්කම්භය අඟල් වලින් | දැරිය හැකි බර. ටයරයකට ගෙනයා හැකි බර මින් පෙන්වයි | වේග සලකුණ. ටයරයේ උපරිම වේගය |

## ආරක්ෂාව සඳහා පිරෙලි

වාහනයත් මාර්ගයත් අතර ඇති එකම දෑ ටයරයයි. එබැවින් ටයරයක් නිවැරදිව පරිහරණය සහ නඩත්තුවට අමතරව ලක්ෂණ පිලිබඳව ද දැණුවත්වීම ඕනෑම අවස්ථාවක ආරක්ෂාව සහතික කිරීමටත්, ටයරයේ ආයුකාලය දිගු කිරීමෙන් මුදල් ඉතිරියටත්, මූලික වන සාධකවේ. තවද පරිසරයට ගරුකරමින් ආරක්ෂිතව රිය පැදවීමට ධාරණාය කර ගන්න.

| | |
|---|---|
| 8 mm and 3 mm අතර | ඉතාමත් හොඳ තත්වයේ ටයර් |
| 3 mm and 1.6 mm අතර | ටයර් මාරු කිරීම සුදුසුයි |
| 1.6 mm ට වඩා අඩු | ටයර් මාරු කිරීම අත්‍යාවශ්‍යවේ |

සටහන ඃ වැඩි විස්තර සඳහා කරුණාකර 27 පිටුව බලන්න





# ටයරයක ගෙවීම

කට්ටවල ගැඹුර පරීක්ෂාව

කට්ටවල ගැඹුර කිසිවිටක නීත්‍යනුකූල සීමාව එනම් කාර්, කැරවෑන් සහ බර වාහන සඳහා මි.මී 1.6 සීමාවට අඩු නොවිය යුතුය. නීත්‍යනුකූල සීමාවට අමතරව ආරක්ෂිත සීමාවන් තුළ සිටීමට ටයරයේ කට්ට වල ගැඹුර මි.මී 3 ක් පමණ වන විට එය ඉවත් කිරීමට පිරෙලි රෙකමදරු කරයි.

තෙත්වූ මාර්ගවල ක්‍රියාකාරීත්වය කට්ට වල ගැඹුරට සාපේක්ෂව වෙනස්වේ.

mm = මිලි මීටර





ටයරයේ ගෙවීමට සාපේක්ෂව තෙත් වූ මතුපිටක නතර වන දුර



## ටයරයක වායු පීඩනය

ටයරයක වායු පීඩනය නිවැරදිව පවත්වා ගන්න

ටයරයක වායු පීඩනය ඔබගේ ආරක්ෂාවට සෘජුවම බලපායි. අවම වශයෙන් මාසයකට වරක් ටයර් සිසිල්ව ඇතිවිට සහ දුර ගමනක් යාමට පෙර සැමවිටම ටයරයක වායු පීඩනය නිවැරදි දැයි සොයා බැලිය යුතය. නිවැරදි වායු පීඩනය ඇති ටයර් වලින් වාහනයක් නැවතිය හැකි දුර අඩු පීඩනය ඇති ටයර් සහිත වාහනයක් නැවැත්වීමේ දුරට වඩා අඩුවේ.




මූලාශ්‍රය : පිරෙලිහි අභ්‍යන්තර පරීක්ෂණ


ටයරයේ වායු පීඩනයට සාපේක්ෂව නතර වන දුර 100% 106%





## ටයරයක අඛණ්ඩතාවය

ටයරයක පෙනෙන හානි

පදික මංතීරු පැති, වලවල් සහ අනෙකුත් බාධක වලින් ටයරයක ඇතුල් පැත්ත හානි විය හැකි අතර එම හානි සැම විටම පැහැදිලිව නොපෙනේ. එවන් අවස්ථාවකදී ටයර් පිලිබඳව නිපුණ අයෙකුගේ උපකාරයෙන් ටයරයේ ඇතුල් පැත්ත පරීක්ෂා කරගන්න. ව්‍යුහාත්මක හානි සහිත ටයර් ධාවනයට නුසුදුසු වන අතර වහා පරිහරණයෙන් ඉවත් කල යුතුය.







## කාර්මික තොරතුරු

| රෝදයක බර දර්ශකය/ උපරිම ධාරිතාවය (කි.ග්‍රෑ) | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| බර දර්ශකය | කි.ග්‍රෑ | බර දර්ශකය | කි.ග්‍රෑ | බර දර්ශකය | කි.ග්‍රෑ | බර දර්ශකය | කි.ග්‍රෑ |
| 60 | 250 | 76 | 400 | 92 | 630 | 108 | 1000 |
| 61 | 275 | 77 | 412 | 93 | 650 | 109 | 1030 |
| 62 | 265 | 78 | 425 | 94 | 670 | 110 | 1060 |
| 63 | 272 | 79 | 437 | 95 | 690 | 111 | 1090 |
| 64 | 280 | 80 | 450 | 96 | 710 | 112 | 1120 |
| 65 | 290 | 81 | 462 | 97 | 730 | 113 | 1150 |
| 66 | 300 | 82 | 475 | 98 | 750 | 114 | 1180 |
| 67 | 307 | 83 | 487 | 99 | 775 | 115 | 1215 |
| 68 | 315 | 84 | 500 | 100 | 800 | 116 | 1250 |
| 69 | 325 | 85 | 515 | 101 | 825 | 117 | 1285 |
| 70 | 335 | 86 | 530 | 102 | 850 | 118 | 1320 |
| 71 | 345 | 87 | 545 | 103 | 875 | 119 | 1360 |
| 72 | 355 | 88 | 560 | 104 | 900 | 120 | 1400 |
| 73 | 365 | 89 | 580 | 105 | 925 | 121 | 1250 |
| 74 | 375 | 90 | 600 | 106 | 950 | 122 | 1500 |
| 75 | 387 | 91 | 615 | 107 | 975 | 123 | 1550 |

# කාර්මික තොරතුරු

**වේග වර්ගීකරණය**

| සංකේතය | උපරිම වේගය පැ.කි.මි |
|---|---|
| L | 120 |
| M | 130 |
| N | 140 |
| P | 150 |
| Q | 160 |
| R | 170 |
| S | 180 |
| T | 190 |
| H | 210 |
| V 240 (2) | 240 (2) |
| W 270 (2) | 270 (2) |
| Y 300 (2) | 300 (2) |
| ZR වැඩි 240 (1) | 240 වැඩි (1) |

**අදාලවන බර (2)**

| වේගය පැ.කි.මි | අදාලවන බර(%) | | |
|---|---|---|---|
| | V | w | ZR(Y) |
| 210 | 100 | 100 | 100 |
| 220 | 97 | 100 | 100 |
| 230 | 94 | 100 | 100 |
| 240 | 91 | 100 | 100 |
| 250 | අවසර නැත | 95 | 100 |
| 260 | අවසර නැත | 90 | 100 |
| 270 | අවසර නැත | 85 | 100 |
| 280 | අවසර නැත | අවසර නැත | 95 |
| 290 | | අවසර නැත | 90 |
| 300 | | අවසර නැත | 85 |
| >300 | | | (*) |

**පරිවර්තන සාධක**

| පරිවර්තනය සඳහා | වෙත | ගුණාකාරය |
|---|---|---|
| මි.මී | අඟල් | 0.03937 |
| අඟල් | මි.මී | 25.4 |
| කි.ග්‍රෑ | රාත්තල් | 2.2046 |
| රාත්තල් | කි.ග්‍රෑ | 0.4536 |
| බාර් | කි.ග්‍රෑ/ ව.සෙ.මී | 1.0197 |
| කි.ග්‍රෑ/ ව.සෙ.මී | බාර් | 0.98066 |
| බාර් | රාත්තල/ ව.අඟල්(p.s.i) | 14.503 |
| රාත්තල/ව.අඟල්(p.s.i) | බාර් | 0.06895 |
| පැ.කි.මී | පැ.සැ | 0.62137 |
| පැ.සැ | පැ.කි.මී | 1.60935 |

1බාර්= 100 කි.පැ

(1) බර දර්ශකයක් නොමැති ZR ටයර සඳහා උපරිම වේග සීමාවක් නැත. උපරිම වේග සීමාව තීරණය වන්නේ පැටවූ බර, ටයරයේ වායු පීඩනය සහ රථයේ කාර්මික විශේෂාංග අනුවයි.

(2) පැටවූ බරට අනුරූපී බර දර්ශකය අදාල වන්නේ පැ.කි.මී 210 ක් දක්වාය (පැ.කි.මී 240 W සහ පැ.කි.මී 270 Y ටයර සඳහා) අධික වේගවල දී බර ප්‍රතිශතයට දැඩි අවධානය යොදන්න.
(*) වරහන් තුල ඇති වේග සංකේතය සහ බර දර්ශකය මගින් හඳුන්වා ඇත: උදා (91Y). අදාලවන බර සඳහා කරුණාකර අප අමතන්න.

## කාර්මික තොරතුරු

| පීඩන පරිවර්තන සටහන | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| BAR | P.S.I | BAR | P.S.I | BAR | P.S.I | BAR | P.S.I |
| 1 | 14 | 1,8 | 26 | 2,6 | 38 | 3,4 | 49 |
| 1,1 | 16 | 1,9 | 28 | 2,7 | 39 | 3,5 | 51 |
| 1,2 | 17 | 2 | 29 | 2,8 | 41 | 3,6 | 52 |
| 1,3 | 19 | 2,1 | 30 | 2,9 | 42 | 3,7 | 54 |
| 1,4 | 20 | 2,2 | 32 | 3 | 44 | 3,8 | 55 |
| 1,5 | 22 | 2,3 | 33 | 3,1 | 45 | 3,9 | 57 |
| 1,6 | 23 | 2,4 | 35 | 3,2 | 46 | 4 | 58 |
| 1,7 | 25 | 2,5 | 36 | 3,3 | 48 | 4,1 | 59 |

1 bar = 100 kPa

## වාහන හිමිකරුවන්ට උපදෙස්

### 1. ටයර් තෝරා ගැනීම

- ටයරයේ ප්‍රමාණය සහ වර්ගය තෝරා ගැනීමේ ක්‍රියාවට රථයේ ප්‍රමාණය, උපරිම වේගය (වේග සංකේතය), ඇක්සලයකට දැරිය හැකි උපරිම බර (බර දර්ශකය) සහ වාහනය පරිහරණය කරන කාර්යය අදාලවේ.

### 2. ඉවත් කිරීම සහ සවි කිරීම

- ටයරයට සහ රිම් එකට හානි නොවන අන්දමට ටයරය ඉවත් කිරීම සහ සවි කිරීමේ කාර්යය නිවැරුදි උපකරණ ඇති විශේෂඥයෙකුට පැවරීමට පිරෙලි උපදෙස් දෙනු ලැබේ.

- රිම් වල තත්වය සොයා බැලිය යුතුය. එය පිරිසිදුව, ඇද වීම් සහ තැලීම් වලින් තොරව හෝ ඉරිතැලීම් සහ මලකඩ වලින් තොර විය යුතුය.

- හානි වූ හෝ කැඩී ගිය රිම් එකක් කිසිවිට අළුත්වැඩියා නොකළ යුතුය.

- රිම් එක මත කාර් ටයරයක විවෘත ප්‍රදේශය නිසි අයුරින් පිහිටුවීමට වායු පීඩනය කිසිවිටක බාර් 3.5 (50 psi) වඩා වැඩි නොකල යුතුය. ටයරය රිම් එකට නිසි අයුරින් සවිවූ විට වායු පීඩනය කාර් රථයේ කාර්මික අත්පොතේ (අයිතිකරුගේ අත්පොත) නිෂ්පාදකයා සඳහන් කල පීඩනයට අඩු කරන්න.

- සුදුසු ටෝර්ක් අඬුවක ආධාරයෙන් නිවැරදි අනුක්‍රමයට රෝදයේ ඇණ තද කරන්න. මෝටර් රථ නිෂ්පාදකයා නියම කරන ටෝර්ක් ප්‍රමාණය පිළිපැදීමට සැළකිලිමත් වන්න.

- අලුත් ටයර් සවි කල අවස්ථාවක පළමු කි.මී 300 (හැතැප්ම 185) මධ්‍යස්ථ වේගයකින් ධාවනය කරන්න. විශේෂයෙන් H/V/W/Y/Z වේග දර්ෂක ඇති ටයර් සවි කල අවස්ථාවක පළමු කි.මී 50 (හැතැප්ම 30) වේගය සීමා කරන්න.

## 3. එකම වර්ගයේ ටයර් සවි කිරීම

- එකම ඇක්සලයට එකම ප්‍රමාණයෙන්, වෙළඳ නාමයෙන්, කට්ට රටාවෙන් එකම බර දර්ශකයන් සහ වේග සංකේතය ඇති ටයර් සවි කිරීමට අවධාරණය කරමු. එයට හේතු වන්නේ විවිධාකාරව නිර්මාණය කරන ටයර් විවිධ ගමන් රටාවන් පෙන්වන බැවිනි. මෙය PLY STEER ANGLE වශයෙන් හඳුන්වන අතර එය රියදුරුට ගමන් කල යුතු දිශාවත් වාහනය නියම වශයෙන් ගමන් කරන දිශාවත් අතර කෝණයවේ. වැඩි PLY STEER ANGLE ඉදිරි ඇක්සලයට යෙදූ විට UNDERSTEER, එනම් වැඩි වක්‍රයකින් වාහනය හැරවෙන අතර වැඩි PLY STEER ANGLE පසු ඇක්සලයට යෙදූ විට OVERSTEER තුලින් වාහනය පාලනය කරගත නොහැකි වීමේ අවධානමක් ඇත.

- ටයර් 2ක් පමණක් සවි කරන විට වාහනය ඉදිරි පස හෝ පසුපස ධාවකයක් වුවත් අලුත් ටයර් පිටුපසට සවි කිරීමට නිර්දේශ කෙරේ.

## 4. භ්‍රමණය වන දිශාව

- එක දිශාවකට පමණක් භ්‍රමණය වීමට නිපදවූ ටයර් වලින් උසස් කාර්යයක් ලබා ගැනීමට නම් දිශාව පිළිබඳව ටයරයේ පැති බිත්තියේ ඇති සලකුණට අවධානය යොමු කල යුතුය.

- කට්ට රටාව සමමිතික ටයර් වල පැති බිත්තියේ ටයරය සවි කිරීම සම්න්ධව කිසිදු සලකුණක් තබන්නේ නැත.

## 5. වායු පීඩනය

- මෝටර් රථ නිෂ්පාදකයා නියම කරන වායු පීඩනය රථයේ කාර්මික අත් පොතෙහි (අයිතිකරුගේ අත්පොත) අඩංගුවේ.

- ඇක්සලයක් මත බර සහ වේගයට සාපේක්ෂව ටයරයක වායු පීඩනය ප්‍රමාණවත් විය යුතුය. ටයර් වල නියමිත වායු පීඩනය සහිතව ධාවනය උසස් කාර්යයක් ලබා ගැනීම, නැවැත්වීමේ හැකියාව, ලිස්සා නොයාම සහ ටයරයේ කල්පැවැත්මට වැදගත්වේ.

- කිසියම් හෝ හේතුවක් මත දිනයේ මුල්වරට ගමන ඇරඹීමට පෙර ටයරයක වායු පීඩනය කාර්මික අත් පොතෙහි (අයිතිකරුගේ අත්පොත) සඳහන් වායු පීඩනයට අඩු හෝ වැඩි නොවිය යුතුය. කෙසේ වෙතත් එම වායු පීඩනය ටයරයේ පැති බිත්තියේ සඳහන් ප්‍රමාණයට වඩා වැඩි නොවිය යුතුය (මෙම අගය psi වලින් දක්වා ඇත).

- ටයරයක් රත්වී ඇතිවිට වායු පීඩනය අඩු නොකරන්න. කෙටි දුරකදී (කි.මී/ සැතපුම් 1 හෝ විනාඩි 2-3) පවා ටයරයක් රත්වන අතර එහි වායු පීඩනය දල වශයෙන් බාර් 0.3 (psi 4 සමාන) දක්වා ඉහල යා හැක.

- වායු පීඩනය අඩුවිට අධික ඇදීම් ඇතිවිය හැකි අතර ඉන් ටයරය සැදූ ද්‍රව්‍යවල අධික රත්වීමක් ඇති වී ටයරය පරිහාණියට පත්වීම වේගවත් වන අතර අවිධිමත් ගෙවීමත් සිදුවේ.

- අවශ්‍ය ප්‍රමාණයට වඩා වායු පීඩනය වැඩි වු විට මාර්ගය හා ටයරය අතර සම්බන්ධය අඩු වීමෙන් අනතුරක දී වන හානිය වැඩි වන අතර ටයරය මැද ප්‍රදේශය ගෙවීම වේගවත්වේ.

## 6. නිතර කල යුතු පරීක්ෂාවන්

- මසකට වරක්, දුර ගමනක් යාමට පෙර සැම විටම ටයර්වල (අතිරේක ටයරය ඇතුලුව) වායු පීඩනය නිවැරදි දැයි පරීක්ෂා කරන්න.
- ඉරි තැලීම්, කැපීම්, ඉදිමීම්, ආගන්තුක ද්‍රව්‍ය හෝ අවිධිමත් ලෙස ගෙවීම් ඇති ටයර් විශේෂඥ යෙකු ලවා පරීක්ෂා කර ගන්න. අවශ්‍ය නම් අලුත් ටයර් සවි කරන්න.
- අවම නීත්‍යනුකූල ගෙවීමේ සීමාව (මි.මී 1.6) සටහන් කරන දර්ශකයක් පිරෙලි ටයර්වල ප්‍රධාන කට්ටවල පාදයේ සටහන්වේ. මෙම සීමාව ටයරයක කට්ට අතර කුමන හෝ ස්ථානයක දක්නට ලැබුනහොත් එම ටයරය ඉවත් කල යුතුය.
- තෙතමනය සහිත මාර්ග වල නැවැත්වීමේ හැකියාව ටයරයක කට්ට වල ගැඹුරට සමානුපාතිකව අඩුවේ. මෙයට අමතරව, පූර්ණ නිර්ණායකට අනුව, ඇඟවීමකින් තොරව වෙනස්විය හැකි කාලගුණික තත්වයන් ගෙන් ස්වාධීනව ආරක්ෂිත සීමාවන් තුල සිටීමට කට්ටවල ගැඹුර මි.මී 3 වනවිට ටයර් ඉවත් කිරීමට උපදෙස් දෙනු ලැබේ.
- කාලයත් සමග ටයරක ආයුකාලය අඩුවන බව සිහි තබා ගත යුතුය. ටයරයක පැති බිත්ති හෝ කට්ට වල ඉරිතැලීම්, ඇතැම්විට පැති බිත්තවල ඉදිමීම් ආයුකාලය අඩුවීමේ දර්ශකයකි. මෙවැනි ටයර් වැඩිදුර පරිහරණයට පෙර විශේෂඥයෙකු ලවා පරීක්ෂාකර ගැනීම සුදුසුය. කෙසේ වෙතත් අවුරුදු 5ක් ඉක්මවූ පසු ගමන් කල දුර සහ කට්ට වල ගැඹුරට ස්වාධීනව අතිරේක ටයරය ඇතුළුව සියළුම ටයර් පරීක්ෂාකර අවශ්‍යතාවය මත ඉවත් කිරීම සුදුසුය.
- ටයර් වල සමබරතාවය නිතර පරීක්ෂාකල යුතුය.

## 7. ටයර් මාරුකිරීම

- කාර්මික අත් පොතෙහි (අයිතිකරුගේ අත්පොත) සඳහන් ආකාරයට ටයර් මාරුකිරීම පිරෙලි අනුමත කරයි. මේ සම්බන්ධව කිසිවක් අත්පොතෙහි සඳහන් නොවන විට ටයර් ගෙවීයාම අඩු කරමින් කල්පැවැත්ම වැඩි කිරීමට කි.මී 8,000-10,000/ සැ 5,000-7,000 අතර ඉදිරි ඇක්සලයේ ටයර් පසුපස ඇක්සලයේ ටයර් සමග එම ආකාරයටම (වම් සහ දකුණු හුවමාරුවකින් තොරව) හුවමාරුවට උපදෙස් දේ.

## 8. වාහනය සමාන්තරගත වීම (බඳ සහ වැසිය)

- වාහනයේ ජ්‍යාමිතික නිවැරදිතාවය මින් අදහස් කෙරේ.

- වාහනයේ ජ්‍යාමිතික නිවැරදිතාවය වරින් වර පරීක්ෂා කිරීමට පිරෙලි උපදෙස් දේ. මෙම පරීක්ෂාවන් අවශ්‍ය වන්නේ අවිධිමත් ලෙස ටයර් ගෙවීමක් වන අවස්ථාවන් හඳුනා ගැනීමටයි.

- ටයරයක් රිම් එකකට සවිකරන සෑම අවස්ථාවකම එම ටයරය සහ රිම් එක එක්ව සමබරතාව පරීක්ෂා කළ යුතුය. ආරක්ෂාවටත් ටයරයේ කාර්යක්ෂමතාවය සහ කල් පැවැත්ම වැඩි කිරීමටත් මෙය වැදගත්වේ.

## 9. ටයර් අලුත්වැඩියාව

- ටියුබ් නොමැති පිරෙලි ටයරයක (පිරෙලි Run-flat ටයර් හැර) කට්ට ඇති ප්‍රදේශයේ ඇති වන මි.මී 6 ට වඩා නොවැඩි වූ සිදුරු අලුත්වැඩියා කල හැක.

- අලුත්වැඩියාවට භාවිත කරන ද්‍රව්‍ය ටයරයේ ඇතුල් පැත්තේ අපාරගම්‍ය ද්‍රව්‍යට හොඳින් සවි විය යුතුය, හානි වූ ස්ථානය හොඳින් ආවරණය විය යුතුය, ස්ථිර අලුත්වැඩියාවක් විය යුතුය.

- හානි වූ ස්ථානය මි.මී 6 ට වඩා වැඩි හෝ එය පැති බිත්තියේ හෝ ඊට මඳක් ඉහලින් හෝ රිම් එකට සවි වන දාරයේ නම් ටයරය ඉවත් කල යුතුය.

- ස්වයං අලුත්වැඩියා ද්‍රව්‍ය ටයරයක ඇතුල් ප්‍රදේශයේ තාවකාලිකව හෝ භාවිතය පිරෙලි අනුමත නොකරයි.

- වේග සංකේත V, W, Y, Z ඇති ටයර් අලුත්වැඩියාව පිරෙලි අනුමත නොකරයි.

- ටයරයක් අලුත්වැඩියා කරන පුද්ගලයා අලුත්වැඩියාවේ සාර්ථකත්වය සහ කල්පැවැත්ම පිලිබඳව හුදෙක් වගකීම දැරිය යුතුය.

## 10. Run-flat ටයර් (වායුව ඉවත් වූ පසුවත් ධාවනය කලහැකි ටයර්)

- Run-flat ටයරයක වායුව ඉවත් වූ පසුවද කි.මී 80 (සැ. 50) පැ.කි.මී 80 (සැ. 50) ක උපරිම වේගයකින් ධාවනය කල හැකි බවට පිරෙලි සහතික වේ. කෙසේ වෙතත් වාහනයේ කාර්මික අත්පොත (අයිතිකරුගේ අත්පොත) පිරික්සන්න.

- වායුව ඉවත් වූ හෝ හානි වූ Run-flat ටයරයක් වෙනුවට ඒ හා සමාන ප්‍රමාණයෙන් ද සේවා විස්තරයෙන් ද (වේග සංකේතය සහ බර දර්ශකය) යුතු Run-flat ටයරයක් ම සවි කල යුතුය.

- Run-flat ටයර් නිර්මාණය කර ඇත්තේ එය සවිකල වාහනයේ ලක්ෂණ වලට අනුකූලවයි. එබැවින් මෙම ටයර් සවිකල යුත්තේ ඒවා සවිකිරීමට නිර්මාණය කල වාහන වලට පමණි. Run-flat ටයර් සවිකරීමේදී වායු පීඩන පාලන සහ අධීක්ෂණ පද්ධතියක් (TPMS) සමග සවි කල යුතුය. ටයර් සහ පීඩන පාලන සහ අධීක්ෂණ පද්ධතිය සවිකල යුත්තේ විශේෂිත බෙදාහරින්නෙකු විසිනි. වායුව ඉවත් වූ අවස්ථාවක ටයරයක දාරය රිම් එකෙන් ගැලවීම වැලැක්වීමට දාරය දිගු EH2 දරන රිම් භාවිතයට පිරෙලි උපදෙස් දේ.

- කරුණාකර ටයරයක පිටත පැති බිත්තියේ ඇති නොතීසි වලට අවධානය යොමු කරන්න.

## 11. ටයර් ගබඩාව

- වාහනයක් දිගු කලක් පරිහරණය නොකරන අවස්ථා වල ටයර් වල පොළොවට ගැටෙන කොටස පැතලි වීම සහ එහි ඇතුළත නිමාව වෙනස් වීම වැලැක්වීමට ටයරයෙහි පීඩනය බාර් 0.5 කින් වැඩි කර වාහනය පොළොවෙන් මඳක් ඔසවා තබන්න.

## 12. වෑල්ව

- වාහනයකට අලුතින් ටයර් සවි කිරීමේදී වෑල්ව ද අලුතින් සවි කිරීම රෙකමදරු කෙරේ. නිතර ටයර් පරීක්ෂා කරන අවස්ථා වල වෑල්වයක මැද ඇති කොටස නිවැරදි බවටද එය හොඳින් තදින් සවිකර ඇති බවටද පරීක්ෂා කළ යුතුය. අවශ්‍ය අවස්ථා වල මෙම කොටස ආදේශ කළ යුත්තේ ටයරයෙන් වායුව පිටවීම මින් වළකන බැවිනි.

- වෑල්ව වල විවෘත කෙලවරේ සවි කරන "කැප්" සියලුම වෑල්ව වල ඇති බවටද හොඳින් සවිව ඇති බවටද එය අතින් කරකවා පරීක්ෂා කළ යුත්තේ ඉන් වෑල්වයේ අභ්‍යන්තරය ආරක්ෂා කරන බැවිනි.

## ටයර් හිමිකම් පිලිවෙත

පිරෙලි ටයර් සුඉස් එස් ඒ. ( Pirelli Tyre Suisse SA.) සහතික කොට සිටිනුයේ ශ්‍රී ලංකාව තුල සෘජුව හෝ බලය ලත් නියෝජිතයෙකු මාර්ගයෙන් සැපයුම් කොට මගී කාර්, වෑන්, සැහැල්ලු ට්‍රක් රථ වල සවි කර ඇති පිරෙලි නාමය සහිත නිෂ්පාදන, මේ හා සම නිෂ්පාදන සාදා ඇති නිෂ්පාදිත අරමුණ ඉටු කර ගැනීම සඳහා පරිහරණයට නුසුදුසු හෝ ද්‍රව්‍යමය අඩුපාඩු වලින් තොර බවත් පරීක්ෂා කර බැලීම සඳහා පිටු අංක 33 සඳහන් කාල සීමාවකට යටත් ව බලය ලත් පිරෙලි කාර්මික ශිල්පියෙකු විසින් භාරගන්නා බවයි.

## අ. නිෂ්පාදිත දිනයේ සිට අලෙවි කල ටයර්

### අවුරුදු 3ක් ඇතුලත

ගමන් කල දුර නොසලකා හැර මිල දී ගත් දින සිට අවුරුදු 3ක් හෝ කට්ට ගෙවීමේ දර්ශකය නිරාවරණය වීමේ අවස්ථාව. මෙම අවස්ථා 2න් පළමු අවස්ථාව.

## ආ. නිෂ්පාදිත දිනයේ සිට අලෙවි කල ටයර්

### අවුරුදු 3කට පසුව

ගමන් කල දුර නොසලකා හැර මිල දී ගත් දින සිට අවුරුදු 6ක් හෝ කට්ට ගෙවීමේ දර්ශකය නිරාවරණය වීමේ අවස්ථාව. මෙම අවස්ථා 2න් පළමු අවස්ථාව.

ඉහත සඳහන් කාලයන් අවසන්වීම සමග ප්‍රකාශිත සහ ව්‍යංග සියළුම වගකීම් අවසන්වේ. පැමිණිලි ඉදිරිපත් කරන විට ටයර් මිලදීගත් ලදුපත හෝ වගකීම් පතේ මුල් පිටපත ඉදිරිපත් කළ යුතුයි.

වගකීම ක්‍රියාත්මක කිරීමට පිරෙලි ටයර් සුඉස් එස් ඒ. (Pirelli Tyre Suisse SA.) වෙත ටයර් පරීක්ෂාවට ඉල්ලීමක් සහ හෝ සියලු කොටස් සම්පූර්ණ කළ ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ යුතු අතර ටයරය බලයලත් පිරෙලි කාර්මික ශිල්පියකුට ඉදිරිපත් කොට පරීක්ෂා කර ගත යුතුයි.

**වගකීමෙන් බැහැරවීම් :**

1) මුලින් ම සවිකළ වාහනයෙන් ඉවත් කර වෙනත් වාහනයකට සවි කරන ලද ටයර්.
2) තුන්වන පාර්ශවයක් අලුත්වැඩියා කළ, නැවත පුරවන ලද සහ නැවත කට්ට කපන ලද ටයර්.
3) සිදුරු වූ සහ අනතුරකදී වූ හානි අලුත්වැඩියා කළ ටයර්.
4) මුල් ටයරයට ද්‍රව්‍ය ආදේශ කළ හෝ ඉන් ද්‍රව්‍ය ඉවත් කළ හෝ ටයරයේ පෙනුම වෙනස් කිරීමට චේතනාන්විතව වෙනස්කම් කරන ලද ටයර්.
5) ද්‍රව තුල්‍යකාරක හෝ කාන්දු වලක්වන ද්‍රව්‍ය ඇතුල් කළ හෝ සාමාන්‍ය හෝ නයිට්‍රජන් වායුව හැර වෙනත් මාධ්‍යයක් යෙදූ ටයර්.
6) සියළුම ආකාරයේ මෝටර් රථ තරඟ සඳහා භාවිත කළ ටයර්.
7) ටයර්/ රිම් නිශ්පාදක විසින් නිර්දේශිත සහ නියම කරන ලද ක්‍රියාකාරී සීමාවන් ඉක්මවා යාම ඇතුලුව නිර්දේශිත ප්‍රමාණයට කුඩා හෝ විශාල, අඩු බර හෝ වේග දර්ශකයක් ඇති ටයර් සවි කිරීමෙන් ප්‍රයෝජනයකට ගත නොහැකි තත්ත්වයට පත් වූ ටයර්.
8) ගමනේදී හෝ වාහනයේ කම්පනය සම්බන්ධ විශමතා ඇති අවස්ථාවක අදාල වාහනය පරීක්ෂාවකට ඉදිරිපත් නොකිරීම.
9) වාහනයේ කාර්මික දෝෂ නිසා ප්‍රයෝජනයකට ගත නොහැකි තත්ත්වයට පත් වූ ටයර්.
10) අවම නීත්‍යනුකූල ගෙවීමේ සීමාව (මි.මී 1.6) පෙන්වන ටයර්.

11) ගින්නෙන්, කාලගුණික තත්ත්ව, රසායනික විඛාදන, අනතුරු, සොරකම්, විනාශකාරී ක්‍රියා, ටයරයේ වායුව අඩුවෙන්, වැඩියෙන් හෝ නැතිව ධාවනය හෝ සේවාවන් වලදී වන අකටයුතු නිසා හානි වූ ටයර්.

12) වැරදි ප්‍රවාහනය සහ ගබඩා කිරීම නිසා වන Flat spotting.

13) මාර්ග වල ඇති ඇණ, වීදුරු කැබලි, යකඩ කැබලි වැනිදෑ හෝ උල් වූ දෑ හෝ ගැටීම් හෝ සීරීම් හෝ නිසා ප්‍රයෝජණයකට ගත නොහැකි තත්ත්වයට පත් වූ ටයර්.

14) වැරදි සවි කිරීම හෝ ගැලවීම නිසා හානි වූ ටයර්.

15) ටයර් බෙදාහරින්නා හෝ වෙළෙන්ද විසින් සවි කිරීම හෝ ගැලවීම නිසා හෝ සමාන්තර කිරීම, තුලය කිරීම හෝ හුවමාරු කිරීම නිසා හානි වූ ටයර්.

16) සන්නාම නාමය, අණුක්‍රමික අංකය හෝ "ඩොට් අංකය" ගෙවී ගිය හෝ වෙනස් කිරීමට තැත්කළ සලකුණු පෙන්වන ටයර්.

17) ටයරයක වයස හෝ දිව ඇති දුර කුමක් වුවත් අවමව එක් කට්ට ගෙවීමේ දර්ශකයක් (Tyre Wear Indicator - TWI) නිරාවරණය වීමකදී ටයරයේ පරිහරණ කාලය අවසන්ව ඇති බව සැළකෙන හෙයින් වගකීම අවසන්වේ. ගෙවීමේ දර්ශකයෙන් කට්ට වල නීත්‍යණුකූල වන අවම ගැඹුර පෙන්වයි. මෙය කාර් සහ සැහැල්ලු ට්‍රක් රථ සඳහා මි.මී 1.6 ක් වේ.

මෙය පිරෙලි ටයර් සුඉස් එස් ඒ. (Pirelli Tyre Suisse SA.) ප්‍රකාශිත වගකීම වන අතර සුවිශේෂී කාර්යයකට යෝග්‍ය බවට හෝ අලෙවි කළ හැකි බවට වෙනත් කිසිම ප්‍රකාශිත හෝ ව්‍යංගම වගකීමක් නොවේ. පිරෙලි ටයර් සඳහා වෙනත් බැඳීමක් ඇති කිරීමට මෙම වගකීම පිරෙලි බලයලත් බෙදාහරින්නාට හෝ වාහන නිශ්පාදකයන්ට හෝ වාහන වෙළෙන්දන්ට හෝ අන් කිසිම අයෙකුට වෙනස්කල නොහැක.

කිසියම් අක්‍රමිකතාවයක් ඇති වූ විටක මෙම වගකීමේ අඩංගු දේ හැර කිසිම කාර්යයක් පිරෙලි ටයර් සුඉස් එස් ඒ. (Pirelli Tyre Suisse SA.) අනුමත නොකරයි. නෛතිකව අවකාශය ලැබීමට යටත්ව කිසියම් අක්‍රමිකතාවයක් හේතුවෙන් සෘජු හෝ වක්‍රාකාරව වාහනයක් පරිහරණය කළ නොහැකි තත්ත්වයට පත්වීම, කාලය වැයවීම හෝ අපහසුතාවයට පත්වීම වැනි දෑ වෙනුවෙන් පිළියමක් ලෙස වගකීම හෝ බැඳීම ඇතුලුව සියළු දෑ මින් ඉවත් කෙරේ.

පිරෙලි ටයර් සුඉස් එස් ඒ. (Pirelli Tyre Suisse SA.) වෙනුවට ටොයොටා ලංකා (පුද්ගලික) සමාගම.

# පාරිභෝගික ප්‍රකාශය

අංක ................................................... දරන ජාතික හැඳුණුම් පත හිමි ................................................... වන මා මෙම පිරෙලි සේවා අත්පොත නැතහොත් ටයර් නඩත්තුව, ආරක්‍ෂාව සහ හිමිකම් ප්‍රතිපත්ති සඳහා වූ අත්පොතේ අඩංගු තොරතුරු සහ කොන්දේසි කියවා තේරුම් ගත් බවත්, පිළිගන්නා බවත්, අනුසන් කරන බවත්, ඒවාට අනුකූලව ක්‍රියා කරන බවත් මින් ප්‍රකාශකර සිටිමි.

වාහන ලියාපදිංචි අංකය :...................................................

පාරිභෝගිකයාගේ නම :...................................................

පාරිභෝගිකයාගේ අත්සන :.................................. දිනය :..............................

පාරිභෝගිකයාගේ ජාතික හැඳුණුම් පත් අංකය :.............................................

අනුක්‍රමික අංකය. | |

**සැ.යු : හිතවත් පාරිභෝගිකය, වගකීම් කාල සීමාව තුල ගැටළු ඇති වුවහොත් ටයර් සමග මෙය ද ඉදිරිපත් කරන්න.**

## පාරිභෝගිකයා, මෝටර් රථය සහ ටයර් හඳුනා ගැනීම

පාරිභෝගික නම : ..........................................................................................

ඇමතුම් අංකය : ..........................................................................................

මෝටර් රථයේ නිෂ්පාදිත වර්ෂය : ..........................................................................................

මෝටර් රථයේ නිෂ්පාදනය : ..........................................................................................

මෝටර් රථයේ මාදිළිය : ..........................................................................................

ගමන් කර ඇති දුර : ..........................................................................................

ඇනවුම් අංකය : ..........................................................................................

## ටයර් මිලදී ගැනීමේ වාර්තාව

| ටයරයේ ප්‍රමාණය | අනුක්‍රමික අංකය / ටයරයේ අංකය | විකුණුම් දිනය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |

පැමිණිලි සමග මිලදී ගැනීම තහවුරු කිරීම හෝ ලදුපත ඉදිරිපත් කළ යුතුය.

අත්සන : ..........................................................................

# බලයලත් බෙදාහරින්නාගේ මුද්‍රාව සහ අත්සන

අලෙවි නිලධාරී ඇමතුම් අංකය :

## ටයර් මාරුකිරීමේ වාර්ථාව

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| දිනය | | | | | | |
| දුර (කි.මී) | | | | | | |
| අනාගත සමාන්තර ගත කිරීමට දුර | | | | | | |
| පරීක්‍ෂාව | | | | | | |
| හුවමාරුව/Rotation | | | | | | |
| තුලනය කිරීම | | | | | | |
| සමාන්තර ගත කිරීම | | | | | | |

මතු ප්‍රයෝජනයට සියලුම වාර්තා සුරැකිව තබා ගන්න

## ටයර් මාරුකිරීමේ වාර්තාව

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| දිනය | | | | | | |
| දුර (කි.මී) | | | | | | |
| අනාගත සමාන්තර ගත කිරීමට දුර | | | | | | |
| පරීක්ෂාව | | | | | | |
| භුවමාරුව/Rotation | | | | | | |
| තුලනය කිරීම | | | | | | |
| සමාන්තර ගත කිරීම | | | | | | |

මතු ප්‍රයෝජණයට සියලුම වාර්තා සුරැකිව තබා ගන්න

**සටහන් :**

**සටහන්:**

## Cinturato™
### කාර් සඳහා

OE
ක්‍රියාකාරිත්වය



Cinturato P7

නාගරික
ක්‍රියාකාරිත්වය



Cinturato™ P1
VERDE

සියලු
ගමන්



Cinturato™
ALL SEASON

දිගු කාලීන
සහ ආරක්ෂාකාරී
ගමනාගමනය



Cinturato™ P7
BLUE

## SCORPION™

### SUV සඳහා

මාර්ග වල ක්‍රියාකාරිත්වය



SCORPION VERDE™

සියලු දේශගුණික තත්ත්වවල ක්‍රියාකාරිත්වය



SCORPION VERDE™ ALL SEASON

දුෂ්කර මාර්ග වල ක්‍රියාකාරිත්වය



SCORPION™ ATR

**කාර්මික සහාය සඳහා**

**(011) 2 939 000 දිගු අංක 425**

කාර්, SUV සහ සැහැල්ලු ට්‍රක් ටයර් සඳහා බලය ලත් බෙදා හරින්නා.

**ටොයොටා ලංකා (පුද්ගලික) සමාගම**

පිරෙලි ටයර් අංශය

ටොයොටා ප්ලාසා

අංක 337, මීගමු පාර

වත්තල

දුරකථනः (011) 2 939 000 / 4, (011) 2 939 006

අන්තර්ජාලය : www.toyota.lk